CBSL Opinion

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මිල ස්ථායීතාව: එය අවශ්‍යතාවක් ද?

මිල ස්ථායීතාව යනු ආර්ථිකයක සාමාන්‍ය මිල මට්ටමේ පුළුල් උච්චාවචනයන් නොමැති තත්ත්වයකි. වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, උද්ධමනය ස්ථාවර ව සහ සාපේක්ෂ ව අඩු මට්ටමක පවතින තත්ත්වයකි. මිල ස්ථායීතාව පවත්වා ගෙන යෑම තිරසාර වර්ධනයක් සහ සෞභාග්‍යමත් ආර්ථිකයක් සඳහා පූර්ව අවශ්‍යතාවක් වන බව ආර්ථික විශේෂඥයන්ගේ අදහස යි. මිල ස්ථායිතාව යනු උද්ධමනය නොමැති වීම හෝ ඉතා අඩු මට්ටමක පැවතීම පමණක් නොවේ. හොඳින් සැලසුම් කිරීම සඳහා පහසුකම් සලසමින්, උද්ධමනය බෙහෙවින් වෙනස් නොවන සහ පුරෝකථනය කළ හැකි මට්ටමේ පවතින තත්ත්වයක් පිළිබඳ ව ඉන් අදහස් වේ. සාමාන්‍යයෙන්, වඩා ඉහළ උද්ධමන මට්ටම්වල දී ඉහළ ප්‍රමාණයකින් මිල අස්ථාවරත්වයක් නිරීක්ෂණය වීම සුලභ කරුණකි. මිල ගණන් වේගයෙන් වෙනස් වන අවස්ථාවක් සැලකූ විට, ව්‍යාපාරවලට පිරිවැය විචල්‍යතාව සඳහා යම් මිල ඉහළ දැමීමක් සිදු කිරීමේ අවශ්‍යතාව මතු විය හැකි බැවින්, ප්‍රශස්ත මිලකරණයකින් ඔවුන්ගේ තීරණ සැලසුම් කළ නොහැකි වේ. එම තත්ත්වය ඉල්ලුම අඩු වීමට හේතු වන අතර ව්‍යාපාර බිඳවැටීම් ඉහළ යෑමට මෙන් ම විරැකියාවට ද හේතු විය හැකිය. තම වැය කළ හැකි ආදායමෙන් වැඩි කොටසක් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා වෙන් කිරීමට සිදුවන නිසාත්, මිල ගණන් ඉහළ යෑම සහ මිල අස්ථාවරත්වය හේතුවෙන් අවශ්‍ය වන ප්‍රතිලාභය වැඩි විය යුතු නිසාත් කුටුම්භ විසින් කරනු ලබන ආයෝජන අඩු වනු ඇත. එපමණක් නොව, විකෘති වූ වෙළඳපොළ සංඥා හේතුවෙන් සම්පත් බෙදා හැරීම අකාර්යක්ෂම වනු ඇත. තවද, දිළිඳු ජනයාගේ සහ ස්ථාවර ආදායම් උපයන්නන්ගේ මිල දී ගැනීමේ හැකියාව (ක්‍රයශක්තිය) දැඩි පිරිහීමකට භාජනය වන බැවින් සමාජ-ආර්ථික සමානාත්මතාව පිරිහෙනු ඇත. මිල විචලතාවය හේතුවෙන් වඩාත් අවශ්‍ය පුද්ගලයන් ඉලක්ක කර ගැනීම දුෂ්කර වන නිසා, ආධාරවල සඵලදායීත්වය අඩු වන බැවින්, රජය විසින් මෙම සමාජ අසමානතාවට පිළියම් යෙදීම ද අසීරු වනු ඇත. තවද, එවන් වාතාවරණයන් තුළ දූෂණයට ඉඩ විවර කිරීමක්ද සිදු විය හැකිය. මිල ස්ථායීතාව නොමැති වීමෙන්, ජාත්‍යන්තර තරඟකාරීත්වය අහිමි වීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවයට තර්ජනයක් ඇති වීම වැනි තවත් අංශ කිහිපයකින් ආර්ථිකයකට අහිතකර බලපෑම් ඇති විය හැකි ය. මෙම බහුවිධ කරුණු හරහා, මිල ස්ථායීතාව නොමැති ව ආර්ථික සෞභාග්‍යය අත්කර ගත නොහැකි බව පෙනී යයි.

සාමාන්‍යයෙන්, මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ වගකීම මහ බැංකු වෙත පැවරේ. එම වගකීම ඉටු කිරීමට ගන්නා ක්‍රියාමාර්ග හරහා අදහස් නොකළ අයුරින් අවධමන තත්ත්වයන් ඇති වීමේ අවකාශ නොමැතිවන තරමේ වූ අඩු ධනාත්මක උද්ධමන මට්ටමක් පවත්වා ගැනීමට මහ බැංකු වඩා කැමත්තක් දක්වයි. බොහෝ සංවර්ධිත ආර්ථිකයන්ට දිගුකාලීන ආර්ථික ඉලක්ක කෙරෙහි අවධානය යොමු කිරීමට ඉඩ සලසන, ස්වාධීන මහ බැංකු ඇති අතර, මෙය මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ ප්‍රධාන සාධකයක් වී ඇත. කෙසේ වෙතත්, සංවර්ධනය වෙමින් පවතින රටවල මහ බැංකුවල ස්වාධීනත්වය සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි ය. එසේ වුවත්, මෑත වසරවල දී, දිගුකාලීන ආර්ථික අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා, බොහෝ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ස්වාධීන මහ බැංකු පිහිටුවා ඇත. තවද, විශේෂයෙන්ම පරිපාලනමය වශයෙන් තීරණය කෙරෙන මිල ගණන් සමස්ත උද්ධමනය තීරණය කිරීම සඳහා වැදගත් වන විට, මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර පවතින මනා සම්බන්ධීකරණයක් ද අතිශය වැදගත් වේ. සිය පාරිභෝගික පැසෙහි ආහාර හා බලශක්ති ආශ්‍රිත අයිතම විශාල කොටසක් පැවතීම හේතුවෙන්ද සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හට මිල ස්ථායිතාව ළඟා කර ගැනීම අභියෝගාත්මක විය හැකි ය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ගේ උද්ධමනය බොහෝ විට සැපයුම් ආශ්‍රිත බාධා සහ ගෝලීය වෙළඳ භාණ්ඩ කම්පනවලට ගොදුරු වේ. එපමණක් නොව, මුදල් ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාව සීමා කිරීමට හේතු වන මූල්‍ය අංශයේ සීමිත ව්‍යාප්තිය; තරඟකාරී වෙළඳපොළ නොමැති වීම හේතුවෙන් වෙළඳපොළ ක්‍රියාකරුවන් කිහිප දෙනෙකු අතර වැඩි ඒකාධිකාරී බලයකට මග පෑදීම; සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට දැඩි ලෙස බලපාන දීර්ඝ කාලීන ආයතනික දුර්වලතා යන කරුණු හේතුවෙන් මෙම ආර්ථිකයන් තවදුරටත් අභියෝගයට ලක් වේ.

ඉහළ උද්ධමන තත්ත්වයන් පාලනය කිරීමට මහ බැංකු දරන උත්සාහයන් සඳහා සාමාන්‍යයෙන් ආර්ථිකය යම් ප්‍රමාණයකට සංකෝචනය කිරීමට අවශ්‍ය වන බැවින්, මහ බැංකු විසින් ගනු ලබන ක්‍රියාමාර්ග තුළ ස්වභාවයෙන් ම ස්ථාවරත්වය සහ ආර්ථික වර්ධනය අතර යම් සංතුලනයක් පවතී. හුදෙක් මුදල් ප්‍රතිපත්තියට පමණක් දිගු කාලීන ආර්ථික වර්ධනයක් අත්කර දිය නොහැකි වුව ද, මිල ස්ථායිතාව පවත්වා ගැනීමෙන් දිගුකාලීන ආයෝජන ඉහළ යෑම, මිලදී ගැනීමේ ශක්තිය ආරක්ෂා කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය වඩාත් ශක්තිමත් කිරීම ඔස්සේ දිගුකාලීන ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ. ඒ හරහා, තිරසර වර්ධනය සඳහා පූර්ව අවශ්‍යතා වන ප්‍රාග්ධනය ගොඩනැගීම සහ ඵලදායිතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය වපසරිය නිර්මාණය වේ. එබැවින්, උද්ධමනය ස්ථාවර කිරීම සඳහා කෙටි කාලයකට ආර්ථික වර්ධනය කැප කිරීම මගින් මහ බැංකු ගන්නා ක්‍රියාමාර්ග දිගු කාලයක් පුරා ආර්ථික සෞභාග්‍යය ඉහළ නංවාලමින්, සමාජ සුභසාධනය වැඩිදියුණු කරයි.

ශ්‍රී ලංකාවේ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යෑමේ කාර්යය ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම වේ. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමග, මහ බැංකුවට ව්‍යවස්ථානුකූලව ඉහළ නංවන ලද මහජන වගවීම සමග මෙහෙයුම් ස්වාධීනත්වයක් ලබා දී ඇත. උද්ධමන ඉලක්කය නිශ්චිත ව සඳහන් කරමින්, මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම තුල මහ බැංකුව විසින් සාක්ෂාත් කරගත යුතු කාර්යය දක්වා ඇත. මහ බැංකු පනත, මහ බැංකුවේ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම පමණක් නොව, එහි මහජන වගවීම සහ විනිවිදභාවය වැඩි දියුණු කරන අතර, ශක්තිමත් සහ නම්‍යශීලී ආයතනයකට මග පාදයි. 2024 ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගලාභීන් වන ඩැරන් ඇසෙමොග්ලු, සයිමන් ජොන්සන් සහ ජේම්ස් ඒ. රොබින්සන් වැනි බොහෝ කීර්තිමත් විද්වතුන් විසින් ඉස්මතු කරන ලද පරිදි, ශක්තිමත් ආයතන ජාතියක සාර්ථකත්වයට ප්‍රධාන ලෙස දායක වේ. ඒ අනුව, මහ බැංකු පනත බලාත්මක කිරීම ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයකි.

මිල ස්ථායිතාව තිරසර වර්ධනයක් සහ ආර්ථික සෞභාග්‍යය සඳහා පහසුකම් සලසන තරමට ම, මිල ස්ථායිතාව නොමැති වීමෙන් දැඩි ආර්ථික අර්බුදවලට තුඩු දිය හැකි අතර, එවන් තත්ත්වයන් බොහෝ විට සමාජ-දේශපාලනික කැළඹීම් සමඟ සම්බන්ධ වේ. 2022 ආර්ථික අර්බුදය අතරතුර ශ්‍රී ලංකාව විසින් මෙම ප්‍රතිවිපාක යථාර්ථයෙන්ම අත්විඳින ලදී. විවිධ රටවල ආර්ථික ඉතිහාසයන් නිරීක්ෂණය කිරීමේ දී ඊටත් වඩා දරුණු කාල පරිච්ඡේද සඳහා බොහෝ උදාහරණ සටහන් කළ හැකිය. එබැවින්, මිල ස්ථායිතාව පවත්වා ගැනීම ආර්ථික යහපැවැත්ම සඳහා පමණක් නොව මනා සමාජ-දේශපාලනික පරිසරයක් සඳහා ද අතිශයින් වැදගත් වේ. ඒ අනුව, මිල ස්ථායිතාව යහපත් ආර්ථිකයක් සඳහා අත්‍යවශ්‍ය අංගයකි.

**මිල විචලතාවය සහ ඒක පුද්ගල මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වෙනස්වීම**




ඉහත රූප සටහන 1970 සිට 2019 දක්වා වාර්ෂික උද්ධමනයේ විචලන සංගුණකය මගින් නිරූපණය කරන ලද උද්ධමනයේ විචලතාවය තිරස් අක්ෂය මත නිරූපණය කරයි. මෙම අක්ෂයේ ඉහළ අගයන් ඉහළ මිල අස්ථාවරත්වය, එනම්, මිල විචලතාවයේ වඩා සැලකිය යුතු මට්ටම් නියෝජනය කරයි. 1970 ට සාපේක්ෂව 2019 දී ඒක පුද්ගල මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතාත්මක වෙනස්කම් සිරස් අක්ෂය මත නිරූපණය කෙරේ. මෙම අක්ෂයේ ඉහළ අගයන් ජීවන තත්වයන්හි වැඩිදියුණු වීම් නියෝජනය කරයි. දත්ත ලක්ෂ්‍ය විවිධ රටවල් නියෝජනය කරයි. ප්‍රස්ථාරයේ ඉහළ දකුණු ප්‍රදේශයේ නිරීක්ෂණ අඩු බව මගින් ඉහළ මිල අස්ථාවරත්වය සහ ජීවන තත්වයන්හි වැඩිදියුණු වීම් එකිනෙකින් පරස්පර බැව් පෙන්නුම් කරයි.

දත්ත මූලාශ්‍ර:
ලෝක බැංකුව;
Ha, Jongrim, M. Ayhan Kose, and Franziska Ohnsorge (2023). "One-Stop Source: A Global Database of Inflation." Journal of International Money and Finance 137 (October): 102896.

සටහන: ලබාගත හැකි නිරීක්ෂණ ගණන වැඩි කිරීම සහ COVID-19 වසංගතය අතරතුර බොහෝ රටවල් අත්විඳින ලද අසාමාන්‍ය කම්පනයේ බලපෑම වළක්වා ගැනීමේ අරමුණින් 1970 සිට 2019 දක්වා දත්ත තෝරාගෙන ඇත.